# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022**
**2025 ජූලි**

**මානවශාස්ත්‍ර පීඨය**

## සිංහල

**(නව නිර්දේශය)**

**පුරාතන සිංහල පද්‍ය හා සාහිත්‍ය විචාරය SINH 38214**

පළමුවන කොටසේ පළමු ප්‍රශ්නයත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගිනුත් ඇතුළත් වන සේ ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## 1 කොටස

01. පහත දැක්වෙන පද්‍ය පාඨවල අර්ථ වර්තමාන ලිහිල් බසින් ලියන්න.

ඇ) බෙයන්ද් නැගී බැලූමො රන්වනුන් අතුරෙන්
හිණෑ පිළි ලිහිලස් කතක් ද අප හිමබුයුන් හො

ලම්බු කැරැ (එ)ක පස තබය අතහි අත ළග කොට
ගත අතහි මලකඬෙ එක බල සි(ටි) රනවන කුළැහි

කී වරැජ ද මලදම හිමබුයක අතැ දි(ටි)
මන ගති මා දෙකා බෙයද
බෙලුම වනනෙය

ලබුතිරීයෙන් හා ලී ගත්තනි සවලී
ගළවමිනි මලක් ආ (ත)බ(ය්)
එහි රනවනනට් (ලකුණු 10 යි)

ආ) දිමුතු මුතු විමල් පුලිනතල පත වම්යෝ
කියාලුහු කිරණවූයේ පබළ ලියපෙළ රඳනා

බසුත් සැදි පියන් පනතෙතර දිය තෙරහිම්
පබවත කත සමාමෙන් තුටිනුතුළෙව් යෙහෙළි විල්

පබවත ගලත ගලත සොම් වුවනත දිස්නා
මිණිමුතු පියුම් සිරි හා වෙනසක් නොදත් බිගු රජ

පහළ පියවුරුනි සසල විල් සිලිල්හි බිජු
වැළහි සපුසල් සේ නා බිය දැනැවී පුරපියන් (ලකුණු 10 යි)

ඇ) මැ ඳ ලප වැනි රසඳුන් වැකි යුගනෙත
බ ඳ තරු වැළ මිණි අබරණ සවනත
ම ඳ හස සඳ කැන් පිරි සත නෙත නෙත
ස ඳ මඬලෙකි පැරකුම් රජ වුවනත

දි ය නෙ ත කුල පති මෙ රජු ගෙ මන නඳ
සි රි අ ත රන් දපණෙව් වුවනත සොඳ
ස ව න ත රතු මිණි කැන් රිවි රැස් වැද
පැ හැ ප ත නව පුල් පියුමෙකි ඇම සඳ

වි දු ලිය තර සර තුඟු සිඟු සිරි ගත
උ දු ඉඳු සැව් සිය ඇත එහි මුඳුනත
බු දු කුරු මෙ නිරිඳු රන් කිරුළ'ග පත
රැ ඳු නව මිණි කැන් එ මැ විලසින් යුත

ම හ සෙ න් පිරිවර තරු මැදූ සඳ යුරු
ග න ර න් රතයට නඟිමින් විසිතුරු
මෙ ර දු න් පැදකුණු වන ලෙස පුර'තුරු
සු ද සු න් වේ මැදූ පත් වැනි පුරඳුරු (ලකුණු 10 යි)

ඉ) ඇ ඳ සිතියම් සිත තුටු කර ඇමගේ
න ද දෙන හැම සඳ මඳ මඳ සුළගේ
න ඳ මුතු මිණි රන් රසු දල් පල'ගේ
බැ ඳ රන් දද බබලන මිණි යට'ගේ

සු දු පිරිසිදු වියනුත් උඩ බඳවා
මු දු ඉඳුවර මල් දම් එහි රඳවා
වි දු කිඳු'යුරු රන් රසු දැල් යොදවා
සැදූ සුර සිඳු බඳු වට තිර අදවා

සුවඳි න් බිම පිරිබඩ ගෙන මොනවට
සදමි න් සිහසුන මුතු සේසත් යට
තබමි න් දෙපසෙහි දිලි රන් මිණි වැට
ඉසිමි න් අසෙනිය මල් විසිතුරු කොට

වෙසෙසි න් දුටු දුටු සත සිත පාදා
මෙලෙසි න් මනහර එමඩුව සාදා
සිරසි න් රජු සිරි සරණත නැමදා
සතොසි න් දැන්වූ සඳ ඒ මැතිඳා (ලකුණු 10 යි)

## II කොටස

02. දේශීය පද්‍ය සම්ප්‍රදායේ යථා ස්වරූපය පිළිබඳ අධ්‍යයනය කිරීමට සීගිරි ගීවලින් සැපයෙන පිටුබලය කෙබඳු දැයි නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

03. පොලොන්නරු යුගයේ ගී කාව්‍ය පිළිබඳ විමසීමක් කරන්න.

04. මූලාශ්‍රය සහ මහාකාව්‍ය ලක්ෂණවලට අනුගත වීම කෙරෙහි මූලිකාවධානයෙන් කව්සිළුමිණ කතුවරයාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය අගයන්න.

05. "ශබ්දයේ හා අර්ථයේ මනා සුසංයෝගය පැරකුම්බා සිරිත විශිෂ්ට ප්‍රශස්ති කාව්‍යයක් වීමට බෙහෙවින් ම බලපෑයේ ය." මේ ප්‍රකාශය නිදසුන් ඇසුරින් විභාග කරන්න.

06. ගුත්තිල කාව්‍යයෙහි ඇතුළත් ගුත්තිල හා මූසිල චරිත මඟින් නිරූපණය වන ගුරු-ශිෂ්‍ය සබඳතාව පිළිබඳ විමසීමක් කරන්න.

## III කොටස

07. අලංකාරවාදයේ ප්‍රභවය හා විකාශනය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

08. ''විභාවානුභාවව්‍යභිචාරී සංයෝගාද්‍රස නිෂ්පත්තිඃ'' යන භරතගේ රස සූත්‍රයට අනුව රස නිෂ්පත්තිය සිදුවන අයුරු පැහැදිලි කරන්න.

09. ''ස්ත්‍රීවාදී සාහිත්‍ය විචාරයෙහි බලපෑම හේතුවෙන් නිර්මාණ සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්හි වැදගත් පරිවර්තන සිදුව ඇත.'' තත් මතයෙහි සත්‍යාසත්‍යතාව සනිදර්ශන ව විභාග කරන්න.

10. මනෝ විශ්ලේෂණාත්මක සාහිත්‍ය විචාරය තදනුබද්ධ සංකල්ප චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යාගත ජාතක කතා විමර්ශනයෙහි ලා යොදාගත හැකි ආකාරය සනිදර්ශන ව පහදන්න.

(02 සිට 10 තෙක් පිළිතුරුවලට ලකුණු 15 බැගිනි.)